www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# *නිව් යෝක් ටයිම්ස්* පත්‍රය සහ සිදු නො වුනු ඝාතනය

The New York Times and the murder that wasn't

2018 ජුනි 1

කීව් නගරයේ ජීවත් වන ක්‍රෙම්ලිනය පිලිබඳ ව වාචික විවේචකයෙක් වන රුසියානු ජනමාධ්‍යවේදී ආකේඩි බැබ්චෙන්කෝ, ඔහුගේ නිවසේ දී වෙඩි තබා මරා දමා තිබුනු බව මැයි 29දා යුක්‍රේනියානු දක්ෂිනාංශික තන්ත්‍රය වාර්තා කලේ ය. ජනමාධ්‍යවේදියාගේ මරනයට වග කිව යුත්තේ “රුසියානු ආඥාදායක යාන්ත්‍රනය” බව යුක්‍රේන අගමැති වොලොඩිමීර් රොයිස්මාන් ප්‍රකාශ කරද්දී කීව් තන්ත්‍රය වහා ම මොස්කෝව වෙත ඇඟිල්ල දිගු කලේ ය.

මෙම සිද්ධිය, *නිව් යෝක් ටයිම්ස්, වොෂින්ටන් පෝස්ට්, ගාඩියන්* හා බීබීසී ඇතුලු යුරෝපයේ හා එක්සත් ජනපදයේ මාධ්‍යයන් තුල ප්‍රධාන කතන්දරයක් වෙමින් ඒ පිලිබඳ ප්‍රවෘත්ති විදුලි වේගයෙන් මිනිත්තු කිහිපයක් ඇතුලත භූගෝලය පුරා ගලා ගියේ ය. ඇමරිකානු ප්‍රචාරන යෝධයා ක්‍රියාත්මක විය.

මිනීමැරුම නිවේදනය කල සෑම වාර්තාවක් තුල ම ඒ හා අතිනත ගත් දෙය වූයේ මිනීමැරුම පිටුපස රුසියානු ආන්ඩුව සිටින බවට නිගමනය කිරීම යි. වෙනත් වචනවලින් කියතොත්, එක්සත් ජනපදයේ මාධ්‍යයන් අත්භූත මිනීමැරුමක් නිවේදනය කර එහි විසඳුම ද ක්ෂනික ව ඉදිරිපත් කල හ.

“තම තියුනු විවේචනාත්මක පුවත් ආවරනය සමගින් රුසියානු ජාතිකවාදීන් අතර කෝපය ඇවිල වූ හිටපු යුද පුවත් වාර්තාකරුවෙක් වන මාධ්‍යවේදී ආකේඩි බැබ්චෙන්කෝ මරා දැමීම, රුසියාව තුලත් ඉන් ඔබ්බේත් ජනාධිපති ව්ලැදිමීර් පුටින්ගේ සුප්‍රකාශිත හතුරන් එල්ල කරන, බොහෝ විට මාරාන්තික වන, ප්‍රහාරයන්ගේ නවතම එක යි” යනුවෙන් *නිව් යෝක් ටයිම්ස්* පත්‍රයේ කීර්තිධර වාර්තාකාර ඇන්ඩෲ හිගින්ස් ප්‍රකාශ කලේ ය.

2014 දී ව්‍යාජ ලෙස සැකසූ ජායාරූප සහිතව යුක්‍රේන භූමියට රුසියානු භටයන් ඇතුලු වීම ගැන තිබූ වාර්තාවක් ඉවත් කර ගැනීමට බල කෙරුනු හිගින්ස් විසින්, මේ වසර මුල සර්ජි හා යුලියා ස්ක්‍රිපාල්ට වස දීම හා 2014 දී යුක්‍රේනයට ඉහලින් පියාසර කල එම්එච්17 ගුවන් යානයක් බිම හෙලීම ඇතුලු පුටින් තන්ත්‍රය විසින් කලා යයි කියන අපරාධවල දීර්ඝ ලැයිස්තුව තුල මෙම මිනීමැරුම තබනු ලැබිය.

*ටයිම්ස්* හා අනෙකුත් ප්‍රධාන පුවත්පත්, ඒවායේ ආවරනයේ දී පදනම් වූයේ, ඔවුන් අඛන්ඩ ව භාවිතා කර තිබෙන පිටපතක් මත ය: එනම්, ක්‍රෙම්ලිනයේ ප්‍රමුඛ විවේචකයෙක් විදේශයක දී මියගිය හොත් හෝ තුවාල ලදහොත් වහා ම මොස්කෝවට දොස් පැවරීම යි. මෙම කියාපෑම් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඒවාට අභියෝග කිරීමට රුසියාව දරන ඕනෑම උත්සාහයක් ක්‍රෙම්ලිනයේ අනර්ථකාරී සැලසුමක් පිලිබඳ වඩ වඩා සාක්ෂි සපයන්නක් ලෙස සලකනු ලැබේ.

එහෙත් මිනීමැරුම අරබයා ජාත්‍යන්තර කෝපාග්නියේ උච්ජස්ථානයේ දී ම අනපේක්ෂිත දෙය සිදු විය. යුක්‍රේන පොලීසිය විසින් කැඳවන ලද මාධ්‍ය හමුවක දී බැබ්චෙන්කෝගේ මලසිරුර නාටකාකාරව යලි පෙනී සිටි අතර, තමාගේ ම මරනය ගැන ව්‍යාජ පුවතක් සැකසූ බව මාධ්‍යවේදියා නිවේදනය කලේ ය.

මෙම කතන්දරය වෙත ආපසු හැරී බලද්දී, යම්කිසි දෙයක් වැරදී තිබුනු බව තේරුම් ගැනීමට සෝස් වර්ගයක් යයි පෙනෙන ද්‍රව කඩිත්තක් මත මාධ්‍යවේදියා වැටී සිටි අයුරු පෙන්වන්නා වූ කීව් විසින් නිකුත් කරන ලද බැබ්චෙන්කෝගේ මලසිරුරේ ජායාරූපය පිලිබඳව කරන පරිස්සම් සහගත විමසුමකට වැඩි දෙයක් අවශ්‍ය නැත.

එහෙත් බැබ්චෙන්කෝගේ පුනරුත්ථානයට ඇමරිකානු මාධ්‍ය ප්‍රතිචාර දැක්වූයේ, ක්‍රෙම්ලිනය චෝදනාවට ලක් කිරීමට වෙනත් ක්‍රමයක් සොයා ගැනීමට උත්සාහ කරමිනි. මේ සඳහා ලාක්ෂනික

උදාහරනය වන්නේ මැයි 31 දා "එය කවරක් වුවත් එය කලේ අප නො වේ" යන හිසින් *නිව් යෝක් ටයිම්ස්* පල කල කතුවැකිය යි.

"ව්ලැදිමීර් පුටින් ව විවේචනය කරන රුසියානු මාධ්‍යවේදියෙකුට වෙඩි තබා තිබුනු බවට වන ප්‍රවෘත්තියක් කිව් වෙතින් අඟහරුවාදා පැමිනි පසු, ක්‍රෙම්ලිනයේ ප්‍රතික්ෂේප කරන යන්ත්‍රනය ඉහලින්ම ක්‍රියාත්මක වීමට වැඩි කාලයක් ගත නො වුනි"යයි *ටයිම්ස්* ලීවේ, කිසිදා සිදු නො වුනු මිනීමැරුමකට තමන් වගකිව යුතු නැති බව කීමට ක්‍රෙම්ලිනය නිර්භය වී යයි පැමිනිලි කරමිනි.

වෙනත් වචනවලින් කියතොත් *ටයිම්ස්* උත්සාහ දැරුවේ, එය විසින් ප්‍රචාරය කල බොරු ගැන මෙම සිද්ධිය විසින් හෙලිදරවු කරන දේ ගැන කියනවා වෙනුවට, කතන්දරය පිලිබඳ වගකීම මොස්කෝවේ "ප්‍රතික්ෂේප යාන්ත්‍රනයට" මාරු කිරීමට යි. ඇත්ත වසයෙන් ම හෙලිදරවු වන දෙය වන්නේ, රටින් පිටත යුද්ධ හා රට තුල දේශපාලන මර්දනය දිරිමත් කිරීම සඳහා රහස් තොරතුරු ඒජන්සීන්ට උපකාරී වන ලෙස ප්‍රවෘත්ති හසුරුවන, *ටයිම්ස්හි* කතුවැකි පිටුවේ කර්තෘ ජේම්ස් බෙනට් විසින් මෙහෙයවනු ලබන ප්‍රචාරක යාන්ත්‍රනය යි. බෙනට් සම්බන්ධයෙන් සැලකූ කල එක් බොරුවක් හෙලිදරවු වීම අඟවන්නේ තවත් මහා බොරුවක් සමගින් පිලිතුරු දීමට කාලය එලඹ ඇති බව යි.

*නිව් යෝක් ටයිම්ස්* පත්‍රයේ අන්තර්ජාල සංස්කරනයේ පල කරන සෑම කතුවැකියක් තුල ම, කර්තෘවාක්‍ය අංශය "ප්‍රවෘත්ති කාමර හා අදහස් දැක්වීමේ අංශවලින් වෙන ම පලවන" බව කියන සටහනක් අඩංගු කරගනී. මෙයට වඩා කිසිවක් සත්‍යයෙන් දුරස් විය නො හැක: ඇත්ත වසයෙන් ම, එම අංශ එකිනෙකින් වෙන්කර හඳුනාගත නො හැක. මුලුමනින් ම තහවුරු නො කරන කියාපෑම් හා සමපේක්ෂන අඩංගු කරගන්නා කතන්දර ප්‍රවෘත්ති පිටුව මත පුරුද්දක් ලෙස පලකරන *ටයිම්ස්,* යුද්ධය හා දේශීය මර්දනය දිරිමත් කරන කතුවැකිවලට ඒවා පදනම් කරගනී.

වසර එකහමාරකටත් වැඩි කාලයක් තිස්සේ, රුසියාව හා එහි සහකරුවන් විසින් ප්‍රචලිත කරන්නේ යයි චෝදිත "ව්‍යාජ ප්‍රවෘත්ති" යනුවෙන් ඔවුන් කියන දෙයට එරෙහි උද්ඝෝෂනයක් තුල එක්සත් ජනපද මාධ්‍ය නිරත වී සිටී. මෙම උද්ඝෝෂනයේ නාමයෙන් එක්සත් ජනපදයේ ප්‍රධාන මාධ්‍ය ද්වාර, ප්‍රමුඛ දේශපාලනඥයින් හා රහස් තොරතුරු ඒජන්සි, සමාජ මාධ්‍ය ගිනුම් දහස් ගනනක් ඉවත් කරමින්, විරුද්ධ අදහස් නිශ්ශබ්ද කරමින් හා සෙවුම් ප්‍රතිඵලවලින් වාමාංශික ප්‍රවෘත්ති අඩවි වලලා දමමින්, එක්සත් ජනපද ඉතිහාසයේ වඩාත් ම විශාල පරාසයේ අන්තර්ජාල වාරනය පැටවීම සාධාරනීය කර ඇත.

එහෙත් ආකේඩි බැබ්චෙන්කෝගේ මිනීමැරුම පිලිබඳ ප්‍රෝඩාව සැබෑ "ව්‍යාජ ප්‍රවෘත්ති" පතුරවන්නන් කවුරුන්දැයි පෙන්වා ඇත. එනම්, වාරනයට ඉලක්ක වන විරුද්ධ අදහස් දරන ප්‍රවෘත්ති අඩවි නො ව, නිව් යෝක්, වොෂින්ටන්, ලන්ඩනයේ ප්‍රධාන ධාරාවේ ප්‍රවෘත්ති කාමර යි.

ආන්ද්‍රෙ ඩැමොන්

© www.wsws.org